## විවේචනය සඳහා ලැබී ඇති පොත්

1. නිදහස් ලංකාවේ ඉංග්‍රීසි ඉගෙනීමේ අභිනව පරමාර්ථ.
New Aims of Learning English in Independent Ceylon.

කර්තෘ: බන්ධුල ශ්‍රී ගුණවර්ධන.
දීපානි මුද්‍රණාලය, නුගේගොඩ, මිල ශත 50 යි.

නිදහස් ලංකාවේ ඉංග්‍රීසි ඉගැන්වීමෙහි පරමාර්ථ, වාණිජ, ආර්ථික, දේශපාලන, සාහිත්‍යමය, අධ්‍යාපනික වශයෙන් නොයෙක් අයුරින් කල්පනා කර බලා ලියා ඇති කුඩා ග්‍රන්ථයකි. මෙය, ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් වෙන් වෙන්ව නමුත්, එකම පොතක් වශයෙන් පළ කොට ඇත.

2. ඉගැන්වීමේ මූලධර්ම

ඩබ්. එම්. රයිබර්න් (පරිවර්තක: බන්ධුල ශ්‍රී ගුණවර්ධන).
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1965.
මිල: රු. 6.00 යි.

මෙහි කර්තෘ සඳහන් කරන අන්දමට මෙම ග්‍රන්ථයෙන් උත්සාහ කර ඇත්තේ ඉගැන්වීමේ මූලධර්ම හා ඒ මූලධර්මවල ප්‍රායෝගික ප්‍රතිඵල ද අතර පවත්නා දැඩි සම්බන්ධතාව විදහා පෙන්වීම ය. මෙම ග්‍රන්ථය ඉගැන්වීමේ පරමාර්ථය, ඉගැන්වීමේ ස්වභාවය, ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ මූලධර්ම, ඉගැන්වීමේ ක්‍රම, ඉගැන්වීමේ ස්වභාවය, ඉගැන්වීමේ නීති, ඉගෙනීමේ ක්‍රම හා පාසල් විෂය මාලාව යන පරිච්ඡේද අටකින් සමන්විත ය.

3. බුද්ධකාලීන භාරත සංස්කෘතිය.

ජේ. පී. ද සොයිසා (පරිවර්තක: බන්ධුල ශ්‍රී ගුණවර්ධන).
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964.
මිල: රු. 4.50 යි.

හැඳින්වීම ඇතුළුව පරිච්ඡේද 22 කින් සමන්විත මෙම ග්‍රන්ථය බුදුන් වහන්සේ දවස භාරතයේ පැවති සමාජය සහ සංස්කෘතිය හෙළිකරන්නා වූ කෘතියකි. ඉංග්‍රීසියෙන් රචිත මෙම ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කිරීමෙන් ගුණවර්ධන මහතා කර ඇත්තේ ශාස්ත්‍රීය සේවයකි.

කරුණාරත්න විජේතුංග.